# ග්‍රාමීය ආන්තික ජන කොට්ඨාසයන්හි ජීවන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක් (රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මනන කන්ද ගම්මානය ඇසුරින්)

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඒ.ඩී.සී.අධිකාරි*[1]
*යූ.ඒ.චන්ද්‍රසේන*[2]

සංක්ෂේපය

ලෝකයේ බොහෝ ප්‍රදේශවල වෙනස් වෙනස් සංස්කෘතීන්ගෙන් සමන්විත මිනිස් සමූහයන්ගේ ආර්ථික සමාජ ජීවිතය ශිෂ්ටාචාරයන්හි වැඩීමත් සමඟ විවිධත්වයක් දක්නට ලැබේ. එසේ සෑම රටකටම හෝ ප්‍රදේශයකටම සීමාවී පැවත එන පරම්පරාවනට අයත් ඔවුන්ට විශේෂිත වූ භාෂාවක්, සංස්කෘතියක් හා ජීවන රටාවක් හිමි හුදෙකලා වූ ජන කොට්ඨාසයක් ජීවත් වෙති. මොවුන්ගේ සාම්ප්‍රදායික ජීවන රටාවන් දියුණු යැයි පවතින සමාජ ක්‍රමය හා මිශ්‍ර වී අනුගත වීමක් දැකිය හැකි අතරම, ඔවුන්ගේ සාම්ප්‍රදායික අනාගතය සුරක්ෂිතව පවත්වා ගෙන යාම දක්නට ලැබේ.

ශ්‍රී ලංකාවේ  සමාජ ව්‍යුහය ගැන විමසීමේදී වඩා කැපී පෙනෙන සාධකය බවට පත්ව ඇත්තේ එහි සමාජ යහපැවැත්ම අභියෝගයකට නතු කොට ගනිමින්, මතුව එන ''සමාජ ආන්තිකකරණයයි''. එය සමාජය තුළ ඍණාත්මක බලපෑම් අඩු කරයි.

ඈත අතීතයේ පටන් සමාජයේ ක්‍රමික විකාශනයත් සමඟ විවිධ වූ කුඩා කණ්ඩායම් ලාංකික සමාජ ක්‍රමය තුළ ස්ථාපනය වුවාක් සේම, මේ හරහා ආන්තිකකරණයට පත්වූ මනන කන්ද ගම්මානයේ ජන කොට්ඨාසයන්හි ජීවන තත්ත්වය පිළිබඳ ආර්ථික, සමාජ හා සංස්කෘතික සන්දර්භයද සැලකිල්ලට ගනිමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක අංශ දෙක නියෝජනය වන පරිදි ප්‍රධාන විධික්‍රම තුනක් මඟින් අධ්‍යයනය කරන ලදී.

ජීවන දත්ත ලබා ගැනීම සඳහා මනන කන්ද ගම්මානය තුළ ජීවත්වන මුළු පවුල් 57 අතරින් පවුල් 30ක සමන්විත නියැදියක් තෝරා ගනු ලැබීය. ප්‍රථමික හා ද්විතියික මූලාශ්‍රයයන් මඟින් දත්ත රැස් කළ අතර, දත්ත ඉදිරිපත් කිරීමේදී ප්‍රස්ථාර, වගු ආදියද, අධ්‍යයන ප්‍රදේශය පිළිබඳ තොරතුරු සිතියම් මඟින්ද ඉදිරිපත් කර තිබේ.

මනන කන්ද ජන කොට්ඨාසයන්හි ජීවන තත්ත්වය පිරික්සීම තුළින් නිගමනය වුයේ, ඔවුනටම ආවේණික වූ ජීවන පිළිවෙතකට හැඩ ගැසුණු, මහා සමාජ ධාරාව සමඟ මිශ්‍ර වීමට මැලිකමක් දක්වන්නා වූ, මූලික අවශ්‍යතාවයන්ගෙන් පවා සංතෘප්ත නොවූ ඉතාමත් දුෂ්කර ජීවන පිළිවෙතක් ගත කරන ජන කණ්ඩායමක් ලෙසයි.

ඔවුන්ට ආවේණික හුදෙකලා සංස්කෘතිය තුළින් මුදවා ගැනීමට  ආකල්පමය වශයෙන් වෙනසක් ඇති කළ යුතු බව යෝජනා කරනු ලැබීය.

මුඛ්‍ය පදඃ ආන්තිකකරණය, හුදෙකලාභාවය, සංස්කෘතික, ජීවන තත්ත්වය, සාම්ප්‍රදායික

1.භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය Chathuadhikari009@gmail.com
2. මහාචාර්ය, භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය